# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2359/60 – 2023 නොවැම්බර් මස 25 වැනි සෙනසුරාදා – 2023.11.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2022/06.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

සමස්ථ ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත (යුනියන් පෙදෙස), කොළඹ 02.

*සහ*

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, යක්කල, ගම්පහ පාර, නැඹිලි කොටුව වත්ත, අංක 03, රමාල් අයි. සිරිවර්ධන මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.


1A – G040843 – 16 (2023/11)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2022/06.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

සමස්ථ ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත (යුනියන් පෙදෙස), කොළඹ 02.

*සහ*

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

“ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සේවය කරනු ලබන ජී. එච්. උදය සමන් මහතාට 2021 අනුමත සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය අනුව, පහත සඳහන් උසස්වීම් හිමිද, හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද, අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.

1. 1994 සිට 2004 දක්වා (වසර 10 කින්) MA (Tec) iii ශ්‍රේණිය
2. 2004 සිට 2009 දක්වා (වසර 05 කින්) MA (Tec) ii ශ්‍රේණිය
3. 2009 වර්ෂයේ සිට JM තනතුර
4. JM තනතුරේ අවුරුදු 05 කින් එනම් 2014 වර්ෂයේ සහකාර අධ්‍යක්ෂ තනතුර’’

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදි.

EOG 11 - 0288

---

මගේ අංකය: IR/COM/01/2021/37.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ආර්. එම්. පී. ආර්. පී. රාජපක්ෂ මිය, අංක 84, ඉදිපරපේ, මීරිගම.

*සහ*

ලංකා ධිවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමඟ, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රාජගිරිය, ඔබේසේකරපුර, ඇසළ උද්‍යාන පාර, අංක 46/7 අහමඩ් ලෙබ්බේ මොහමඩ් සලීම් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2021/37.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. එම්. පී. ආර්. පී. රාජපක්ෂ මිය, අංක 84, ඉඳිපරපේ, මීරිගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමඟ, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ** –

“ 2012.04.01 දිනට මාස 3 කට පෙර සභාපති රහස්‍ය ලේකම් තනතුරට පත් කළ අයට ලබාදී ඇති වරප්‍රසාද 2012.04.01 දින සාමාන්‍යාධිකාරී රහස්‍ය ලේකම් තනතුරට පත්කළ ආර්. එම්. පී. ආර්. පී. රාජපක්ෂ මියට හිමිද, හිමි නම් ලබා නොදීම මඟින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, ආර්. එම්. පී. ආර්. පී. රාජපක්ෂ මියහට නව බඳවා ගැනීමේ සේවක ඇස්තමේන්තුව අනුමත වීමට ප්‍රථම MM-1-1 ශ්‍රේණිය ලබා දී ඇති මෙම තනතුර නව බඳවා ගැනීමේ පටිපාටිය මඟින් JM-1-1 තනතුර ලෙස වෙනස් කිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.’’

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 11 - 0289

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.